අද 2016 03.23

DEPARTMENT OF CENSUS & STATISTICS
LIBRARY
COLOMBO



# 2016 පෙබරවාරි උද්ධමනය ඉහළ යයි

## - ජාතික පාරිභෝගික මිල දර්ශකයේ 1.1% ක අඩුවීමක්

**සමිල පෙරේරා**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (2013=100) විචලනය මගින් මනිනු ලබන උද්ධමනය, ලක්ෂ්‍යමය පදනම මත 2016 ජනවාරි මාසයේදී වාර්තා කළ -0.7% හි සිට 2016 පෙබරවාරි මාසයේදී 1.7% දක්වා ඉහළ ගොස් තිබේ.

එහිදී, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 2016 පෙබරවාරි මස ජාතික පාරිභෝගික මිල දර්ශකය 110.8 ලෙස ගණනය කර ඇත. පෙබරවාරි මාසයේ දර්ශකය ජනවාරි මාසයේ දර්ශකය (112.0) හා සංසන්දනය කළ විට 1.2 ක දර්ශකාංක අඩුවීමක් හා ප්‍රතිශතයක් ලෙස 1.1% ක අඩුවීමක් වාර්තා වේ. මේ සඳහා ආහාර කාණ්ඩයේ වටිනාකම් වෙනස 1.22% කින් අඩුවීම හා ආහාර නොවන කාණ්ඩයේ වටිනාකමේ වෙනස 0.11% කින් වැඩිවීම බලපා ඇත.

2016 ජනවාරි මාසය හා සැසඳීමේදී 2016 පෙබරවාරි මාසය සඳහා ආහාර කාණ්ඩයේ වටිනාකමේ වෙනස අඩුවීම සඳහා එලවළු, සහල්, අමු මිරිස්, ලොකුලූනු, රතුලූනු, අර්තාපල්, දෙහි, පොල් සහ පොල්තෙල් යන ආහාර ද්‍රව්‍යවල මිලෙහි අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. එසේ වුවත් කරවල, අලුත් මාළු, පැපොල්, සීනි, අඹ සහ සුදුලූනු යන ආහාරවල මිලෙහි වැඩිවීමක් වාර්තා වී ඇත.

2016 ජනවාරි මාසය හා සසඳීමේදී 2016 පෙබරවාරි මාසය ආහාර නොවන කාණ්ඩයේ වටිනාකම් වෙනසෙහි 0.11% ක වැඩිවීමක් දක්නට ඇත. මෙම ආහාර නොවන කාණ්ඩයේ වටිනාකමේ වෙනස වැඩිවීම සඳහා 'නිවාස, ජලය, විදුලිය, ගෑස්, හා වෙනත් ඉන්ධන' සහ 'විවිධ භාණ්ඩ හා සේවා' කාණ්ඩවල වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. එසේම 'මද්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය', 'ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු' සහ 'සෞඛ්‍ය' යන කාණ්ඩවල වටිනාකමේ වෙනසෙහි සුළු වැඩිවීමක් වාර්තා වී ඇති අතර 'රෙදිපිළි හා පාවහන්' සහ ප්‍රවාහන කාණ්ඩ සඳහා වටිනාකමේ වෙනසෙහි සුළු අඩුවීමක් දක්නට ඇත. ජාතික පාරිභෝගික මිල දර්ශකය නිවේදනය කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය අමර සතරසිංහ මහතා කියා සිටියේ 2016 පෙබරවාරි මාසය සඳහා වාර්ෂික උද්ධමනය 1.7% ලෙස ගණනය කොට ඇති බවයි. පසුගිය ජනවාරි මාසය සඳහා එම අගය -0.7% ලෙස වාර්තා වූ බවත් හෙතෙම සඳහන් කරයි. 2015 පෙබරවාරි මාසයේ රජය විසින් ක්‍රියාත්මක කළ අතුරු අයවැය යෝජනාවෙන් එල්.පී. ගෑස්, භූමිතෙල්, පෙට්‍රල්, ඩීසල්, බස් ගාස්තු සහ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය කිහිපයක මිල අඩුකිරීමෙහි බලපෑම මෙම වසරේ පෙබරවාරි මාසයේදී ඉවත් වීම නිසා 2016 පෙබරවාරි මාසයේ උද්දමනය වැඩිවීමට ප්‍රධාන වශයෙන් බලපා ඇති බවද පෙන්වා දෙයි.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් නවතම පාරිභෝගික මිල දර්ශකය මිල දර්ශකය වන ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 =100) 2015 ඔක්තොබර් මස සිට අදාළ ලිත් මාසය අවසන් වී 21 වැනිදින ප්‍රකාශයට පත් කරනු ලැබේ.